---

සමන්තුරේ ප්‍රාදේශිය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 10 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 18 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 දෙසැම්බර් 31 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව සමන්තුරේ ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට සමන්තුරේ ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

1.3.1 ගණකාධිකරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ .

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172(2) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා ඇති පහත සඳහන් ආදායම් විෂයයන්හි අවසාන ශේෂයන් ආදායම් ලේඛණයෙහි දක්වා ඇති ප්‍රමාණයන් ගෙන් වෙනස් වි තිබුණි.

| ආදායම් විෂයය | මූල්‍ය ප්‍රකාශයන් | ආදායම් | වෙනස |
|---|---|---|---|

| | | අනුව ශේෂය | ලේඛණය අනුව ශේෂය | |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් සහ බදු | 5,431,491 | 9,585,536 | 4,154,045 |
| (ii) | බදු කුලී | 6,353 | 388 | 5.965 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 13,347,395 | 2,346,394 | 11,001,001 |
| (iv) | වෙනත් ආදායම් | 1,888,576 | 102,063 | 1,786,513 |

## 2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු . 5,868,967 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු . 6,923,386 ක් විය .

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයට අයවිය යුතු දීර්ඝ කාලයක් හිඟහිටි රු.3,232,958 ක් වූ ශේෂය පියවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ආපසු ගෙවිය යුතු තැන්පතු වල ඇතුළත් රු.4,190,623 ක් වූ භාණ්ඩ හා සේවා බදු නොපියවා අඛණ්ඩව දීර්ඝ කාල පරිච්ඡේදයක් තිස්සේ ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) සභාවට අයවිය යුතු රු.20,121,120 ක් වූ හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මස් වෙළඳ සැල් බදුදීම සම්බන්ධ තැන්පතු රු.6,728,840 ක් ආදායමට ගෙන නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිග ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් සහ බදු | 1,000 | 3,455 | 5,431 |
| (ii) | බදු කුලී | 10,600 | 8,425 | 15,385 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,300 | 676 | - |
| (iv) | වෙනත් ආදයම් | 2,150 | 273 | 4,635 |

### 2.3.2 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින් ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු.9,919,138 ක් විය .

### 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක ශ්‍රේණි | 01 | - |
| සහායක ශ්‍රේණි | 22 | 20 |
| සුළු ශ්‍රේණි | 52 | 52 |
| වෙනත් | - | 31 |
| | 75 | 103 |

### 2.5 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) ගිණුම්කරණය

( ආ ) මූල්‍ය පාලනය

( ඇ ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය